# හතර වැනි සියවසේ පැවති දාර්ශනික හා ආගමික මතවාදයන්ට විරුද්ධ වූ කයිසාරියේ බැසිල් තුමන්ගේ දේවධාර්මික චින්තනය

එස්. එම්. ඩී. එම්. එස්. එස්. මුදලිගේ[1]

හතර වැනි සියවසේ දී ක්‍රිස්තියානි සභාවේ ශුද්ධ වූ ත්‍රිත්වය ලෙස පියාණන්, පුත්‍රයාණන් හා ශුද්ධාත්මයාණන් වහන්සේගේ මැදිහත් වීමත්, ක්‍රිස්තුන් වහන්සේගේ දේව පුත්‍රභාවය පදනම් කරගනිමින් ඒරියස් හා ඉනෝමියස් යන පුද්ගලයන් විසින් ඇති කරන ලද දුර්මතවාදයන්ට විරුද්ධ ව බැසිල් තුමන්ගේ දේව ධාර්මික ඉගැන්වීම් කොතෙක් දුරට සාර්ථක වූයේ ද යන්න පිළිබඳ ව විමර්ශනාත්මක ව අධ්‍යනය කිරීම මේ පර්යේෂණ පත්‍රිකාවේ මූලික අභිමතාර්ථය වේ. බැසිල් තුමන්ගේ දේව ධර්මය පිළිබඳ විද්වත් ග්‍රන්ථ සහ ලිපි මේ අධ්‍යයනයට පදනම් වේ. මෙහි දී ඒ ඉගැන්වීම්වලට හේතු වූ දුර්මතවාද මොනවාද යන්න තවදුරටත් පැහැදිලි කරගැනීම සඳහා විමර්ශනීය ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි අධ්‍යයනය කෙරේ. හතර වැනි සියවසේ පැවති සමාජ, ආර්ථික හා දේශපාලනික පසුබිම ද එමඟින් පැහැදිලි කිරීමට අපේක්ෂා කරන අතර බැසිල් තුමන් මෙවැනි දේව ධාර්මික සංකල්පයන් ඉදිරිපත් කිරීමට හේතු වූ දුර්මතවාද ද එතුමන් ඒ දුර්මතවාදවලට එරෙහි ව ක්‍රියාකාරී වූ ආකාරය පිළිබඳ ව ද මේ අධ්‍යයනයෙන් සාකච්ඡා කෙරේ.

**ප්‍රමුඛ පදඃ** සාන්ත බැසිල්, ත්‍රිත්වය, කපදෝසියානු පියවරු, ක්‍රිස්තියානි සභාව, දේව ධාර්මික සංකල්ප

[1] බටහිර සම්භාව්‍ය හා ක්‍රිස්තියානි සංස්කෘති අධ්‍යයනාංශය